TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල සුරකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබැන්ක් පාර, කොළඹ 5

19 ඔක්තෝබර්, 2019.

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>මැතිවරණ කාලපරිච්ඡේදයේදී මුල්ගල් තැබීමේ උත්සවයක් සම්බන්ධවයි.</u>

2019 ඔක්තෝබර් 15 දින වන දින වරාය නියෝජ්‍ය අමාත්‍ය ත්‍රිකුණාමලය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අබ්දුල් මහරූෆ් මහතා විසින් කින්නියා කුරුංඥන්කේනි මහහත් නගර් ප්‍රදේශයේ ක්‍රීඩා පිටිය නවීකරණයට මුල්ගල තැබීම කින්නියා ප්‍රාදේශීය සභාවේද මූලිකත්වයෙන් සිදු කර තිබූ බව, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මැතිවරණ නිරීක්ෂක අප වෙත වාර්තා කරන ලදී. මිට අදාළ ඡායාරූප මේ සමග අමුණා ඇත.

මැතිවරණයක් කැඳවා ඇති අවස්ථාවකදී මෙසේ මහජන නියෝජිතයන් මැතිවරණ නීති කඩකරමින් මුල්ගල් තැබීමේ උත්සව වලට සහභාගීවීම මගින් එක් විශේෂ දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය වීමේ හැකියාව ඇති අතර 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 3 (I) යන නියමයන් ද උල්ලංඝනය වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා නැගෙනහිර පළාත් සම්බන්ධීකාරක කවින් හෙට්ටිආරච්චි මහත්මා හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා හෝ 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැලැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.

මෙයට,

විශ්වාසී,

Lakvijaya Bandara
............................

ලක්විජය බණ්ඩාර

ජාතික සම්බන්ධීකාරක (PPPR)



